**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka

2025.11.17

**'අයවැයට පක්ෂව ඡන්දය දුන් මනෝට විනය ක්‍රියාමාර්ගයක්' මැයෙන් ලංකාදීපයේ වාර්තා කළ ප්‍රවෘත්තිය මා තරයේ හෙළා දකිමි.**

සමගි ජන සන්ධානය නියෝජනය කරන ප්‍රජාතන්ත්‍රවාදී මහජන පෙරමුණේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මනෝ ගනේෂන් මහතාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට පක්ෂය තුළ ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බවට ලංකාදීප පුවත්පත හරහා වාර්තා කර ඇති ප්‍රවෘත්තිය සම්පූර්ණ අසත්‍යයක් බවත්, එය පදනම් විරහිත නිර්මාණයක් බවත් මා සමගි ජන සන්ධානයේ නායකයා ලෙස අවධාරණය කරමි.

සමගි ජන බලවේගයේ කිසිදු ක්‍රියාකාරිකයෙකු හෝ කණ්ඩායමක් විසින් ගරු මනෝ ගනේෂන් මන්ත්‍රීතුමාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් කිසිදු සාකච්ඡාවක් පවත්වා නොමැති බවත්, එවැනි පියවරක් ගැනීමට කිසිසේත්ම බලාපොරොත්තු නොවන බවත්, මා ඉතා වගකීමෙන් ප්‍රකාශ කරමි.

රට බරපතළ අර්බුදයක පවතින මොහොතක, එම තත්ත්වය යටපත් කරමින්, විපක්ෂයේ සමගිය බිඳ දැමීමේ සහ මහජනතාව නොමඟ යැවීමේ නීච අරමුණින් ක්‍රියාත්මක වන ඇතැම් "මාධ්‍ය කොන්ත්‍රාත්කරුවන්ගේ" මෙවැනි අභූත චෝදනා සහ නොමඟ යැවීම් මා පිළිකුලෙන් යුතුව හෙළාදකිමි.

මීට පෙරද මොවුන් විසින් අවස්ථා ගණනාවකදී සමගි ජන බලවේගයේ නායකයා වන මා හට එරෙහිවද මඩ ප්‍රචාර දියත් කරමින් සමගි ජන බලවේගය තුළ අර්බුදයක් නිර්මාණය කිරීමට උත්සාහ දැරූ අතර එය ඉටු නොවූ කළ යළිත් වටයකින් සමගි ජන සන්ධානයට සම්බන්ධ පක්ෂ නායකයින් සහ අප අතර විරසකයක් නිර්මාණය කිරීමට කුමන්ත්‍රණ දියත් කරමින් සිටින බව මෙවැනි ප්‍රවෘත්ති හරහා හොඳින්ම පැහැදිලි වේ.

ජනතාව ප්‍රතික්ෂේප කළ පරාජිත දේශපාලඥයින්ගේ අරමුණ වී ඇත්තේ, පිරිසිදු දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් අප සමඟ පෙළගැසී සිටින විපක්ෂයේ දේශපාලන පක්ෂ නායකයින් අතර ගැටුමක් නිර්මාණය කර යළිත් වටයකින් එහි වාසිය ජනතාව තලාපෙළන රජයට ලබාදීමය.

ජනාධිපතිවරණයේ සිටම ඔවුන්ට අවශ්‍යයව තිබුණේ කුමක්ද යන්න මේ රටේ බුද්ධිමත් ජනතාවට දැන් හොඳින්ම පැහැදිලි වෙමින් තිබේ.

කලක් මෙම මාධ්‍ය ආයතනය තුළ කලක් සේවය කළ පුද්ගලයින් වර්තමානයේ එම පරාජිත දේශපාලඥයින්ගේ මාධ්‍ය කොන්ත්‍රාත්තුව භාරගෙන සිටින බවද අප දනිමු.

මා හට මෙන්ම සමගි ජන බලවේගය සම්බන්ධව ද අසත්‍ය පුවත් මැවීම හරහා එම පුවත්පත් ආයතනය මේ වනවිට ජනතාව අතර ප්‍රතික්ෂේප වී ඇති අයුරු මුළු රටටම පෙනෙන්නට තිබේ.

බංකොලොත් දේශපාලනයේ අවශ්‍යතා ඉටු කිරීමේ ප්‍රතිඵල ලෙස අද එම ආයතනයට සේවක වැටුප් ගෙවීමට පවා නොහැකිව, සේවක අයිතීන් උල්ලංඝනය කරමින් සිටින පසුබිමක, ඔවුන්ට අවධාරණය කිරීමට ඇත්තේ, බොරු ප්‍රචාර ඔස්සේ මා ඇතුළු සමගි ජන බලවේග කිසිදු ලෙසකින් බිඳ දැමිය නොහැකි බවයි.

සමගි ජනබලවේගයේ නායකයා ලෙස සහ විපක්ෂ නායකවරයා ලෙස, මෙවැනි අසත්‍ය සහ ද්වේෂ සහගත ප්‍රචාරණයන් මා තරයේ හෙළා දකින අතර, මෙලෙස අසත්‍ය තොරතුරු ජනගත කරමින් ජනතාව මුලා කිරීම්වලට එරෙහිව ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද අදාළ මාධ්‍ය ආයතනවලට සහ පුද්ගලයින්ට අවධාරණය කර සිටිමි.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක.

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com